www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉංග්මා බර්ග්මාන් (1919-2007): ඇගයීමක් සහ ශෝකාලාපයක්

## Ingmar Bergman (1918-2007): An appreciation and a lament

**මාර්ටි ජෝන්ස් විසිනි**
**2007 අගෝස්තු 17**

ජූලි 30වන සඳුදා සිදු වූ මයිකල්ඇන්ජලෝ ඇන්ටෝනියෝනි සහ ඉංග්මා බර්ග්මාන් යන චිත්‍රපට අධ්‍යක්ෂවරුන් දෙදෙනාගේ සමපාතීය මරන සමගින් අපගේ අවධානයට ලක්වන්නේ හුදෙක් ශ්‍රේෂ්ට කලාකරුවන් දෙදෙනෙකුගේ මිය යාම පමනක් නොව ලෝක සිනමාවේ ශ්‍රේෂ්ට පරම්පරාවක අවසානය යි. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* දැනටමත් ඇන්ටෝනියෝනිගේ වෘත්තීය ජීවිතය පිලිබඳ අදහස් දක්වා ඇති අතර මෙහි ලා මගේ අභිප්‍රාය වන්නේ බර්ග්මාන්ගේ වැදගත් කම පිලිබඳ අදහස් කිහිපයක් පල කිරීම යි.

අර්නස්ට් ඉංග්මා බර්ග්මාන් 1918 දී ස්වීඩනයේ උප්සලා හි උපත ලැබීය. ලූතර්වාදී පූජකයෙකු වූ ඔහුගේ පියා තම මූලධර්මවාදී ආගමික විශ්වාසයන් මත පදනම්ව තමන්ගේ දරු තිදෙනාව දඬුවම්වලට ලක් කල දැඩි සහ කෲර පුද්ගලයෙකි. ඔහුගේ මවගේ දයාවට සීමා පනවනු ලැබ තිබිනි. ඔහුගේ ඇති දැඩි වීමේ මෙම අංශ, ඔහුගේ විශ්වාසයන් සහ ආකල්ප ඔප මට්ටම් කිරීමට ද ඔහුගේ චිත්‍රපට තුල නැවත නැවත ඉස්මතු වීමට ද නියමිත විය.

විශ්ව විද්‍යාල ජීවිතයෙන් පසුව 1941 දී බර්ග්මාන් රංග ශාලාව සමග සම්බන්ධ විය. ශේක්ෂ්පියර් සහ ස්ට්‍රින්බර්ග්ගේ කෘති අධ්‍යක්ෂනය කල ඔහු තමාගේ ම නාට්‍ය ලිවීම ඇරඹීය. ඔහුගේ වැඩ කටයුතු ස්වීඩනයේ ප්‍රධාන චිත්‍රපට සමාගම වූ ස්වෙන්ස්ක් ෆිල්ම්ඉන්ඩස්ට්‍රි හි අවධානයට ලක්වූ අතර, ඔහුගේ ප්‍රථම තිර රචනය වන 1944 දී ඇල්ෆ් ෂෝබර්ග් විසින් අධ්‍යක්ෂනය කරන ලද *ටෝමෙන්ට්* (වේදනාව) රචනා කිරීමට පෙර දිගු ආධුනිකත්ව කාල පරිච්ඡේදයක් ගත කලේ ය.

චිත්‍රපට තුල තම පිය සටහන් තබන අතර ම මූලික වසයෙන් නාට්‍ය ක්ෂේත්‍රයේ පුද්ගලයෙකු ලෙස රැඳී සිටි ඔහු, තමාගේ ජීවිතයේ ඉතිරි කාල පරිච්ඡේදය රංග ශාලාව හා චිත්‍රපටය බෙදාගෙන කටයුතු කිරීමට නියමිත විය. වයස අවුරුදු 26 දී හැල්සින්බෝර්ග් නාගරික රංග ශාලාවේ අධ්‍යක්ෂවරයා වූ ඔහු, උතුරු යුරෝපයේ ප්‍රධාන රංග ශාලාවක අධ්‍යක්ෂ තනතුර දැරූ ලාබාලතම තැනැත්තා විය. නාට්‍ය රචනා කරමින් මෙන් ම ඒවා අධ්‍යක්ෂනය කරමින් ද ස්ටොක්හෝම් සහ මැල්මෝ හි අනෙකුත් රංග ශාලාවල ප්‍රධානත්වය දැරීමට ද ඔහු ඉදිරියට ගියේ ය. ඔහු අධ්‍යක්ෂනය කල චිත්‍රපට 42න් බහුතරයක් සඳහා ඔහු ම තිර රචනය කල අතර නාට්‍ය රචනා කිරීමෙන් ඔහු ලැබූ අත්දැකීම චිත්‍රපට සඳහා ඉතා හොඳින් උපකාරී වන්නට ඇත.

1948 එලිදුටු *පෝට් ඔෆ් කෝල්* (කතා දොරටුව) සහ 1949 තිරගත වූ *තර්ස්ට්* (පිපාසය) වැනි බර්ග්මාන්ගේ මුල් චිත්‍රපටවල දී ඉතාලියානු චිත්‍රපට තුල ආධිපත්‍යය දැරූ නව යථාර්ථවාදයේ බලපෑම පෙන්නුම් කරයි. පසුකාලීනව ඔහු, පවුල් සබඳතා සහ ලිංගික අනුරාගය සියුම් ලෙස සෝදිසි කරන්නා වූ සහ දෙවියන්ගේ පැවැත්ම ප්‍රශ්නයට ලක් කරන්නා වූ චිත්‍රපට තැනීමට නියමිත විය. පශචාත් යුද අපේක්ෂා භංගත්වයේ මනෝ ගතියක් යුරෝපය අරක්ගෙන සිටි අතර ප්‍රංශයේ සාංදෘෂ්ටිකවාදීන් මෙන් ම බර්ග්මාන් ද මෙය තම චිත්‍රපට තුලින් ප්‍රකාශයට පත් කලේ ය.

රාගය, උමතුව සහ ප්‍රමෝදය විසින් බිඳ දමන ලද මෙම අපේක්ෂා භංගත්වය 1955 දී නිර්මානය කල *ස්මයිල්ස් ඔෆ් අ සමර් නයිට්* (ගිම්හාන රාත්‍රියක මදහස) යන විශිෂ්ට ව්‍යතිරේකය හැරුනු විට ඔහුගේ නිර්මාන පුරා දිව යයි. එම සුවිශේෂී චිත්‍රපටය ගැන කියතොත් චිත්‍රාගාරය ඔහුට හාස්‍ය ජනක චිත්‍රපටයක් නිර්මානය කිරීමට නියම කල අතර ඔහු ආකර්ෂනීය ලෙස සාර්ථක විය. *ත්රූ අ ග්ලාස් ඩාක්ලි* (වීදුරුවක් තුලින් අඳුරු ලෙස) (1961), *වින්ටර් ලයිට්* (සිසිර ආලෝකය) (1961) සහ ද *සයිලන්ස්* (නිශ්ශබ්දතාවය) (1962) යන ඔහුගේ තුන් ඈඳුත්ත තුල දෙවියන් අපව හැර දමා ගොස් නිශ්ශබ්දව සිටින විශ්වයක් උපකල්පනය කරනු ලැබේ.

තම චිත්‍රපට තැනීමේ දී බර්ග්මාන් ඔහුගේ නාට්‍ය කන්ඩායමේ සාමාජිකයන් යොදා ගත්තේ ය. එම කන්ඩායමට හැරියට් ඇන්ඩර්සන්, ගුනා හෝන්ස්ට්‍රැන්ඩ්, ලිව් උල්මාන්, මැක්ස් වොන් සිඩොව්, ඉන්ග්‍රිඩ් ටියුලින් සහ අර්ලන්ඩ් ජෝසෆ්සන් ආදීන් අයත් වූ අතර මෙම ශිල්පීහු ම බර්ග්මානගේ කීර්තිමත් සිනමා ජීවිතය පුරාම මෙන් ම ඔහුගේ නාට්‍ය නිෂ්පාදනවලට ද දිගට ම

සම්බන්ධ වීමට නියමිත වූහ. වොන් සිඩොව් සහ උල්මාන් වැනි සමහරු ජාත්‍යන්තර සිනමා තාරකාවන් බවට පත්වීමට නියමිත වූහ. විශිෂ්ටතම සිනමා කලාකරුවන් දෙදෙනෙකු වන ගුනාර් ෆිෂර් සහ ස්වෙන් නික්විස්ට් සමග ද ඔහු වැඩ කලේ ය.

බර්ග්මාන්ට නොදන්වා ස්වෙන්ස්ක් ෆිල්ම්ඉන්ඩස්ට්‍රි විසින් උලෙලට ඉදිරිපත් කරනු ලැබූ *ගිම්හාන රාත්‍රියක මදහස* චිත්‍රපටයට බලාපොරොත්තු නො වූ ලෙස 1956 කෑන්ස් චිත්‍රපට උලෙලේ විශේෂ ජූරි සම්මානය හිමිවීමෙන් පසුව එම චිත්‍රපට සමාගම ඔහුට අභිමත ලෙස කටයුතු කිරීමට ඉඩ දුනි. ඉන් ඉක්බිති ඔහු, තමන්ට ජාත්‍යන්තර පිලිගැනීමක් ගෙන දුන් ද *සෙවන්ත් සීල්* (හත්වැනි මුද්‍රාව) චිත්‍රපටය 1957 දී තැනූ අතර එය එක්සත් ජනපදයේ "කලා නිවාස" චිත්‍රපට ශාලා දියත් කිරීමට උපකාරී වූ චිත්‍රපට දෙක තුනෙන් එකක් බවට අනියමින් පත් විය.

මෙම චිත්‍රපටයේ, නයිට් වරයෙක් (වොන් සිඩොව්) තමන්ගේ ඉඩම් හිමියා (හෝන්ස්ට්‍රෑන්ඩ්) ද සමග ශුද්ධ වූ භූමියේ කුරුස යුද්ධයෙන් පසු වසංගතය සහ ආගමික උන්මාදය විසින් විනාශභාග කරන ලද දහ හතරවන ශත වර්ෂයේ ස්වීඩනය බලා පෙරලා පැමිනෙති. සෑම තැනක ම මල කඳන් ය, මායාකාරියන් ලෙස සලකා කාන්තාවන් පුලුස්සා දමනු ලැබේ, ආගමික උත්තේජනය සඳහා තමන්ට ම පීඩා කර ගන්නවුන්ගේ පෙරහැරවල් ගම්මාන හරහා යති. නයිට්වරයා කුරුස යුද්ධයේ වටිනාකම සහ දෙවියන්ගේ පැවැත්ම සැක කරයි. ධවල මුහුනකින් යුතුව කාල වර්න කබායකින් සැරසී සිටින මරනයේ චරිතය නයිට්වරයා පසු පසින් එන අතර සිනමාවේ එක් සුප්‍රකට දර්ශනයක, ඔවුහු (නයිට්වරයා සහ මරනය -පරිවර්තක), නයිට්වරයාගේ ජීවිතය ඔට්ටුවට තබා චෙස් ක්‍රීඩාවේ යෙදෙති. චිත්‍රපටය අවසන් වන්නේ තවත් ප්‍රතිමූර්තිමය දර්ශනයක් සමගිනි. එනම්, රාත්‍රී අකාසයට විරුද්ධව සිටිමින් අඳුරු සෙවනැලි සහිත ශරීර සමගින් නර්තනයේ යෙදෙන මරනයේ චරිතය සමග යි.

තිරගත වූ පසු කිහිප වතාවක දී ම අනුකරනය කෙරුනු සහ සම්භාවනාවට පාත්‍ර වූ මෙම චිත්‍රපටය බර්ග්මාන් ව ජාත්‍යන්තර ප්‍රේක්ෂකයන්ට හඳුන්වා දුනි. එය ගෙතී තිබුනේ ඔහුගේ ප්‍රධාන තේමාවන්ගෙන් එකක් වන අපව ගනනට නො ගන්නා හෝ නො පවතින දෙවියන්ව මුහුනට මුහුන ලා හමුවීමයි.

බර්ග්මාන්ගේ යෝධ නිර්මාන ප්‍රතිදානය මෙම ගැටලුව මෙන් ම උමතු භාවය සහ විශේෂයෙන් ම පවුල් සබඳතා ඇතුලත් පුද්ගලික සබඳතාවල ලතෝනිය පිලිබඳව සලකා බලමින් ඉදිරියට යාමට නියමිත විය.

මානව සබඳතාවල බිඳෙන සුලු බව සහ සංකීර්නත්වය පිලිබඳව නිමැවූ කැපී පෙනෙන නිර්මානයක් වන්නේ ප්‍රථමයෙන් ස්වීඩන රූපවාහිනිය සඳහා කෙටි මාලා නාටකයක් ලෙස නිමවා සංක්ෂිප්ත ස්වරූපයෙන් නාට්‍යානුසාරයෙන් එලි දැක්වුනු *සීන්ස් ෆ්‍රොම් අ මැරේජ්* (විවාහයකින් දර්ශන) (1973) නම් නිර්මානය යි. කුඩා සමූහයක් සහ චරිත අඩු ප්‍රමානයක් සමගින් කන්ඩායම් නාට්‍ය ලෙස වේදිකාගත කෙරුනු වසර ගනනාවක් ඇදී ගිය මෙම චිත්‍රපටය "පරිපූර්න" විවාහයක කැඩී බිඳී යාම පෙන්නුම් කරයි.

චිත්‍රපටයේ එන යුවල (ජෝසෆ්සන් සහ උල්මාන්) වෙන් වී නැවත එක් ව යලිත් වරක් වෙන් වන අතර තමන් කැමති වුවත් නැතත් ජීවිතයේ පටලැවී ඇති බව හඟිති. පිලිගැනෙන ආකාරයට බර්ග්මාන්ගේ ම සබඳතා මත පාදක වන කෙටි චිත්‍රපට මාලාව සත්‍ය වසයෙන් ම ආලෝචනාත්මක, සිත් ගන්නා සුලු සහ ශෝකාකුල වේ. එය ස්වීඩන රූපවාහිනියේ පෙන්වන විට නරඹන්නන් රාත්‍රියක් රාත්‍රියක් පාසා රූපවාහිනිය ඉදිරිපිට තබා ගනිමින් ද විවාහ උපදේශකයන්ගේ සහ දික් කසාද වෙනුවෙන් පෙනී සිටින නීතිඥයන්ගේ කාර්යාල පුරවාලමින් ද අතිශය ජනප්‍රියත්වයට පත් විය.

වසර 30කට පසු 2003 දී බර්ග්මාන් නිපදවූ ඔහුගේ අවසන් චිත්‍රපටය වන රූපවාහිනී වෘතාන්තයකට ද නැගු *සරාබෑන්ඩ්* හි දී ඔහු මෙම යුවල කරා යලි පැමිනුනි. මේ අවස්ථාවේ දී යුවල (රඟපාන්නේ පූර්ව දෙදෙනා ම ය) යලි හමුවන අතර ජෝසෆ්සන් විසින් රඟන චරිතය 1973 දී අප ඔහු හැර එනවිට තිබුනු අවාසනාවන්ත භාවයටත් වැඩියෙන් ගැඹුරට කිඳ බසී. එක් පවුල් ලතෝනියක් තවත් එකක් නිපදවද්දී ඔහු තමාට වෛර කරන පුත්‍රයෙක් සමග පොර වදිමින් සිටී.

චිත්‍රපටකරුවකු ලෙස ගත්කල බර්ග්මාන් යෝධයෙකි. විශේෂයෙන් කාන්තාවන් ඇතුලත්ව ඔහුගේ චරිත පිලිබඳව ඔහුට තිබූ ආලෝචනාව අර්ථාන්විත සහ අනුග්‍රහශීලී වේ. ඇන්ටෝනියෝනි මෙන් නොව, බර්ග්මාන් ශ්‍රාවකය සහ චරිත අතර හැඟීම්වල දුරස්ථ භාවයක් නො තබයි. ලතෝනිවලින් මෙන් ම ආනන්දයන්ගෙන් ද අනූන තමන්ගේ ම අතීතයට හා සම්බන්ධතාවලට දිරිමත්ව පිවිසෙන ඔහු, අන් බොහෝ චිත්‍රපටකරුවන්ට වඩා ඍජු හා බලගතු ලෙස ඒවා තිරයට නගයි. 1982 දී එලිදුටු *සීන්ස් ෆ්‍රොම් අ මැරේජ්* සහ *ෆැනී ඇන්ඩ් ඇලෙක්සැන්ඩර්* වැනි චිත්‍රපටවල දී බර්ග්මාන් ප්‍රේක්ෂකයන් මෙන් ම තමන් කෙරෙහි ද විනිවිද භාවයෙන් යුතුව සලකයි.

තම කැමරා ශිල්පීන් වන ෆිෂර් සහ නික්විස්ට් සමග සහයෝගීව ඔහු තියුනු සහ බලගතු පරිකල්පන රූප තිරය මතට ගෙන ආවේ ය. ඔහුගේ කලු සුදු චිත්‍රපටවලට ස්කැන්ඩිනේවියානු සිසිර ඍතුවක නීරස භාවය හෝ ගිම්හාන දිනයක ප්‍රමෝදය උපදවිය හැකි ය. නිශ්ශබ්ද වේවා සමෘද්ධිමත් වේවා පසුව ඔහු විසින් වර්න භාවිතා කරනු ලැබීම, ඉහල මධ්‍යම පන්තියේ

නිවාසවල සහ තෘන සහිත ග්‍රාමීය ප්‍රදේශවල විස්තර හා ආකෘතීන් අලලා ගත්තේ ය.

බර්ග්මාන්ට මෙය සත්‍යවාචී විය. තම චරිතවලට ඔහු කොතරම් වේදනාකාරී ලෙස සමීප වුවත් ඓතිහාසිය සහ දේශපාලනික ධාරාවන් සම්බන්ධයෙන් නො සැලකිලිවන්ත විය.

බර්ග්මාන් තම චරිතවල ජීවිතයට ඔබ්බෙන් තිබෙන ලෝකය දෙස ක්ෂනික බැලුම් හෙලන චිත්‍රපට කිහිපයක් ද තිබේ. උදාහරනයක් ලෙස *තර්ස්ට්* හි, කුසගින්නේ පෙලෙන ජනකායක් ජර්මනියේ දුම්රියපොල කරා ලඟාවන යුවලක් සිටින දුම්රථයේ ජනේලය ලඟට විත් සිඟා කති. පසු බිමින් අපට දැක ගන්නට ලැබෙන්නේ බෝම්බ හෙලීමෙන් විනාශ වුනු ගොඩනැගිලිවල දර්ශනයන් ය. *ද සයිලන්ස්* හි හෝටලයේ ජනේලය අසල සිටින විට භූමිය සමතලා කරගෙන වීදි ඔස්සේ ටැංකි පැමිනෙන හඬ ඇතින් ඇසේ. *ෆැනී ඇන්ඩ් ඇලෙක්සැන්ඩර්* චිත්‍රපටයේ දී පවුලේ යුදෙව් මිතුරකුගේ සමහර ගති ලක්ෂනවලින් නිෂපන්නිත ප්‍රති-සෙමිටික්වාදයේ ලේශ මාත්‍රයක් දැක ගත හැක. එහෙත් බාහිර ලෝකය පිලිබඳ මෙම සුලුපහේ ඇඟවුම් පවතින්නේ එම චිත්‍රපටවල පරිධියේ ය.

ඔහුගේ බොහෝ නිර්මානාත්මක ශක්තීන් තිබියදී ම එතරම් සංවේදී කලාකරුවෙකුට තමන්ගේ චරිත ජීවත්වන සහ අවසාන විග්‍රහයේ දී එම ජීවිත හැඩගස්වන ලෝකය නො තකා හැරීම හෝ එහි භූමිකාව ලඝු කිරීම කල හැකිවන්නේ කෙසේ ද?

බර්ග්මාන්ගේ පුද්ගලික ජීවිතයේ මුල් කාල පරිච්ඡේදයෙන් මෙම නො සැලකැලිමත් බව තේරුම් ගැනීමට උපකාර ලැබේ. වයස අවුරුදු 16 දී ඔහු ජර්මනියේ තුරින්ගෙන් හි නාසි දේව ගැතියෙකුගේ පවුල සමග ජීවත් වීමට අන්‍යොන්‍ය හුවමාරු ශිෂ්‍යයෙකු ලෙස පිටත් විය. සති හයක් ඔහු එහි ගත කල අතර 1934 දී වයිමාර් හි පැවති නාසි පක්ෂයේ රැලියකට සහභාගි වීම චිත්තවේගී තාරුන්‍යයේ උද්යෝගය දල්වාලී ය. නාසි සමාචාරයට තම හස්තය එසැවූ ඔහු, හිට්ලර්ගේ කතාව පිලිබඳ ජනකායේ උන්මාදය මගින් ඇදගෙන යනු ලැබීය. 1987 දී පල වූ *ද මැජික් ලැන්ටර්න්* (ඉන්ද්‍රජාලික ලන්තෑරුම-මෙය පහනක ආධාරයෙන් කුඩා පින්තූර විශාල කොට පෙන්වන යන්ත්‍රවකි (පරිවර්තක)) නමැති බර්ග්මාන්ගේ ස්වයං චරිතාපදානය තුල ඔහු මෙසේ ලි යයිඃ "අවුරුදු ගනනාවක් ම මම හිට්ලර්ගේ සාර්ථකත්වයන් අසා සතුටු වෙමින් ද ඔහුගේ පරාජයේ දී දුක් වෙමින් ද ඔහුගේ පාර්ශවයේ සිටියෙමි."

නාසීන් කෙරෙහි බර්ග්මාන්ගේ අනුග්‍රහශීලීත්වයන්ට මුක්කුව ලැබුනේ හුදෙක් ඔහුගේ සහෝදරයා ස්වීඩන ෆැසිස්ට්වාදී පක්ෂයේ සමාරම්භකයෙක් හා සංවිධායකයෙක් වීම හා ඔහුගේ පියා එම පක්ෂයට නො කඩවා ඡන්දය දීම පමනක් නොව ඔහු ම ත් ස්වීඩනයේ මෙම උද්යෝගයන් බෙදා හදා ගත් සමාජ වටාපිටාවකට අයත් වීම ය. "අපේ ඉතිහාස ගුරුවරයා 'පැරනි ජර්මනියට' වන්දනාමාන කල අතර අපේ ක්‍රීඩා ගුරුතුමා සෑම ගිම්හානයක දී ම නිලධාරීන්ගේ රැස්කීම්වලට සහභාගි විය. සමහර දේවගැතිවරු ගුප්ත නාසීන් ලෙස කටයුතු කරද්දී පවුලේ සමීපතම මිත්‍රයෝ 'නව ජර්මනියට' බලගතු අනුග්‍රහයක් පල කලහ," යයි බර්ග්මාන් ලියයි.

ඔහු මාරක කඳවුරුවල ප්‍රථම බියජනක ඡායාරූප දැකගත් දෙවන ලෝක යුද්ධයේ අවසානය දක්වා නාසීන් කෙරෙහි ඔහුගේ පක්ෂපාතීත්වයන් පැවතුනි. "වධක කඳවුරුවල දොරටු විවෘත කල විට මට මගේ දෑස් විශ්වාස කිරීමට බැරි වුනා... සත්‍යය හෙලිදරවු වූ විට එය මා හට කටුක පීඩාවක් වුනා. කෲර හා ප්‍රචන්ඩ ලෙස මගේ අවිහිංසකත්වය එක්වර ම ඉරතැලී ගියා" යයි 1999 දී පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක දී ඔහු පැවසී ය.

ෆැසිස්ට්වාදය සමග තමන්ට පැවති දීර්ඝ ආහ්ලාදය විස්තර කරමින් "මතුපිට කාන්තිය මාව අන්ධ කලා. එයට යටින් පැවති අඳුර මා දැක ගත්තේ නැහැ" ඔහු ස්වයං-චරිතාපදානය තුල කියයි. මේවා වනාහි තෘප්තිකර අදහස් නො වේ.

එම පිටුවේ ම අවසාන භාගයට වන්නට 11 වසරක මෙම මුරන්ඩු බොලඳ භාවයෙන් ඔහු උකහා ගන්නා නිගමනය කුමක් ද? "දේශපාලනය-එය නම් මින් මතුවට කිසිදාක එපා!" මෙය කිසිසේත් ප්‍රයෝජනවත් නො වන අතර ඔහු කවර කලෙකවත් ෆැසිස්ට් මුග්ධත්වය කෙරෙහි තමන්ට පැවති ආහ්ලාදය ගැඹුරු විවේචනයකට භාජනය කල බවක් ද ඉන් අදහස් නො වේ. ඔහුගේ ජීවිතයේ හා වැඩ කටයුතුවල ප්‍රධාන ගැටලු තවමත් නො විසඳී පැවතුනි.

මෙම කාල පරිච්ඡේදය සමග මෙන් ම සමහර විට ඔහුගේ විකෘත තාරුන්‍යමය උද්යෝගයන් සමග ද ගනුදෙනු බේරා ගැනීමට 1977 දී එලි දුටු *ද සර්පන්ට්'ස් එග්* (සර්පයාගේ බිත්තරය) නම් චිත්‍රපටයේ දී ඔහු උත්සාහ දැරී ය. ජර්මනියේ දී ඉංග්‍රීසියෙන් තනන ලද ඩේවිඩ් කැරඩින් සහ ලිව් උල්මාන් රඟපෑ එහි කතාව දිල හැරෙන්නේ 1923 වයිමාර් ජනරජය තුල ය. ජර්මනිය අර්බුද ග්‍රස්තව පවතින අතර ප්‍රති-සෙමිටික්වාදය පෘථුලයඃ නාසි මැරවරයන් වීදි පීරමින් යන අතර අහඹු දිවි නසා ගැනීම් මාලාවක් ම සිදු වෙති.

චිත්‍රපටයේ කතා වස්තුව ව්‍යාකූල වන අතර සංක්ෂේපයෙන් දැක්වීමට තරම් සුදුසු නැත. එය විපරීත අවස්ථාවන්, අදක්ෂ දෙබස් සහ නීරස රඟ දැක්වීම්වලින් යුතු දුරවබෝධී සහ වියුක්ත චිත්‍රපටයකි. එහි කලබලකාරී අවසානයේ දී අපට දැන ගැනීමට ලැබෙන්නේ සියලු

දිවි නසා ගැනීම් හා වියවුල් (සහ නාසීන්?) පිටුපසින් සිටින්නේ උමතු විද්‍යාඥකේ බවයි! සැලකිය යුතු පරිදි බොහෝ විචාරකයෝ මෙය බර්ග්මාන්ගේ දුර්වල ම චිත්‍රපටය බවට එකඟ වෙති.

ෆැසිස්ට්වාදය හෝ ස්වීඩන සුලු ධනේශ්වරයට එහි ආකර්ශනය වීම වටහා ගැනීමට බර්ග්මාන් අසමත් වීම ද ඔහු විසින් ම පනවා ගත් දේශපාලනයෙන් දුරස්ථ භාවය ද ඔහුගේ දෘෂ්ටියේ පැහැදිලි සීමාසහිත කම් සලකුනු කරයි. එහෙත් මෙයින් අප ඔහුගේ පෘථුල හැකියාව හෝ කෞශල්‍යයන් පහතට දමන බවක් මින් අදහස් නො වේ.

බර්ග්මාන් වනාහි දෙවන ලෝක යුද්ධයෙන් පසුව තම නිර්මානාත්මක පරිනත භාවයට පත් චිත්‍රපට කරුවන් පරම්පරාවක අවසාන අයගෙන් එක් අයෙකි. තම එකම සංස්කෘතිය චිත්‍රපට සහ රූපවාහිනිය වූ ද චිත්‍රපට ලක්ෂනයන් අත්පත් කර ගැනීමේ අටියෙන් පමනක් පොත්පත් කියවන්නා වූ බොහෝ වර්තමාන අධ්‍යක්ෂවරුන් මෙන් නොව බර්ග්මාන්ගේ පරම්පරාවේ මිනිසුන් සහ ගැහැනුන් කලාවේ සහ සංස්කෘතියේ ඇලී ගැලී ජීවත් වූහ. ඔවුන්ගේ ආනුභාවය සහ බලපෑම ජාත්‍යන්තරික විය.

වෙලස්, කුරසෝවා, සත්‍යජිත් රායි, වජ්ජා, ෆෙලිනි හා බ්‍රෙසන් වැනි සියලු ශ්‍රේෂ්ට අධ්‍යක්ෂවරු එක්කෝ අනෙකුත් සංස්කෘතිකමය ක්ෂේත්‍ර පිලිබඳව දැනගෙන නැතහොත් එම අංශවල ක්‍රියාකාරීව සිටියහ. බර්ග්මාන් අධ්‍යක්ෂනය කලේ හුදෙක් ස්කැන්ඩිනේවියානුවන් වූ ඉබ්සන් සහ ස්ට්‍රින්බර්ග්ගේ නාට්‍ය පමනක් නො වේ: ශේක්ෂ්පියර්, ඉයුජින් ඕනීල්, එඩ්වඩ් ඇල්බී, ඇල්බෙයා කැමූ සහ ටෙනිසි විලියම්ස්ගේ නිර්මාන ද වේදිකා ගත කල ඔහු බොහෝ ඔපෙරා - 1975 දී ඔහු මොසාට්ගේ ද මැජික් ෆ්ලූට් (මායා නලාව) චිත්‍රපටයකට නැගී ය- ද කරලියට ගෙන ආවේ ය. මෙයට අමතරව ඔහු නවකතා සහ කෙටිකතා රචනා කලේ ය.

වෙලඳ අර්ථයකින් පමනක් ජාත්‍යන්තරික සිනමාවක් මගින් විස්ථාපනය කිරීමට නියමිත අන්තර්ධාන වෙමින් පවතින ජාත්‍යන්තරික සිනමාවක විශේෂ ලක්ෂන මේවා ය.

© www.wsws.org